මුදල් අමාත්‍යාංශය
நிதி அமைச்சு
MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01, இலங்கை.
The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: (94)-011-2484500, (94)-011-2484600, (94)-011-2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: (94)-011-2449823
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல / My No: BD/CBP/01/01/02-2021
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2021.07 28

ජාතික අයවැය චක්‍රලේඛ අංක: 01/2021

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
සියළුම රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල සභාපතිවරුන්

**අයවැය කැඳවීම - 2022**

**2022-2024 මධ්‍යකාලීන අයවැය රාමුව තුළ 2022 වාර්ෂික අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම සඳහා මාර්ගෝපදේශ**

කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් පැනනැගී ඇති ආර්ථික අභියෝග කළමනාකරණය කර ගනිමින් වසංගත තත්ත්වය කඩිනමින් පාලනය කර "සෞභාග්‍යයේ දැක්ම" රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව මහජනතාව වෙත ප්‍රතිලාභ ළඟා කර දීමේ අභිලාෂය මුදුන්පත්කර ගැනීම උදෙසා 2022-2024 මධ්‍යකාලීන සාර්ව ආර්ථික රාමුව යටතේ 2022 වසර සඳහා වාර්ෂික අයවැය පිළියෙළ කිරීමට අපේක්ෂිත ය.

සෞභාග්‍යයේ දැක්මෙහි සඳහන් අරමුණු ළඟා කර ගැනීමේ දීර්ඝ ගමනට ශක්තිමත් පදනමක් ඇති කරමින් 2021 වර්ෂයේදී අයවැය සකස් කරන ලදී. එනමුත්, 2021 මුල් කාර්තුවේදී කොවිඩ් -19 වසංගත තත්ත්වය නැවත හිස එසවීම නිසා, අපේක්ෂිත ආදායම් ළඟාකර ගැනීමට බාධා ඇතිවූ අතර ව්‍යසනය නිසා ඇතිවූ අමතර වියදම් හේතුවෙන් සහ පීඩාවට පත් ජනතාවට සහන සැලසීම සඳහා රජයේ වියදම් අනපේක්ෂිත පරිදි ඉහල ගිය හෙයින් මෙම වසරේ අයවැය කළමනාකරණය අභියෝගාත්මකවී ඇත. රටේ බහුතර ජනතාවක් කඩිනමින් එන්නත්කරණය කර මෙම තත්වය හැකිතාක් ඉක්මනින් යථාවත් කරගෙන 2022 වර්ෂය සඳහා නව ප්‍රවේශයකින් කටයුතු කිරීම රජයේ අපේක්ෂාව වේ.

ඉහත දැක්වූ පසුබිම තුළ 2022-2024 මැදිකාලය හා 2022 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තු සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ ලබා දීම මෙම චක්‍රලේඛයේ අරමුණ වේ.

## 2. වියදම් ඇස්තමේන්තු සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ

වසංගත තත්ත්වය හේතුවෙන් පසුබෑමට ලක් වී ඇති රාජ්‍ය ආදායම යථා තත්ත්වයට පත් වීම මන්දගාමීව සිදුවන බැවින් ද, ඉතා ඉහළ අගයක පවතින මධ්‍යම රජයේ ණය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 95 දක්වා අඩු කිරීමට අපේක්ෂිත බැවින් ද, 2022 වර්ෂය සඳහා වන රාජ්‍ය මූල්‍ය අවකාශය පටුවනු ඇති බව සැලකිල්ලට ගෙන 2022 වර්ෂයේ වියදම් ඇස්තමේන්තු සකස් කිරීම සිදුකළයුතු බව අවධාරණය කරමි. එහිදී, විෂයභාර අමාත්‍යවරුන්/ රාජ්‍ය අමාත්‍යවරුන් විමසා ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ සෘජු මැදිහත්වීමෙන් වියදම් තාර්කිකව හා විචක්ෂණශීලීව සමාලෝචනය කිරීමෙන් අනතුරුව අත්‍යාවශ්‍ය හා ඵලදායී වියදම් පමණක් ඇතුළත් කළ යුතුවේ.

වියදම් කළමනාකරණය මෙන්ම ආදායම් උත්පාදනය පිළිබඳව ද දැඩි අවධානයක් යොමුකළ යුතු අතර පවත්නා ආදායම් මාර්ග පුළුල් කිරීමට සහ නව ආදායම් ප්‍රභවයන් කරා යොමු වීමට රජයේ දෙපාර්තමේන්තු ද ඇතුළුව රාජ්‍ය ආයතන කටයුතු කළ යුතුවේ. විශේෂයෙන් ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය ව්‍යාපාර අයවැය මගින් ප්‍රතිපාදන ලබා නොගෙන ස්වකීය මෙහෙයුම් වියදම් ආවරණය කර ගැනීමේ විකල්ප ක්‍රමවේද කෙරෙහි අවදානය යොමු කළ යුතුවේ.

### 2.1 ප්‍රමුඛතා ක්ෂේත්‍ර

සම්පත් වෙන් කිරීමේ දී, රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතාවලට අනුකූලව, 2022-2024 මධ්‍ය කාලය තුල අවසන් කර ජනතාව වෙත ප්‍රතිලාභ ලබාදිය හැකි වැඩසටහන් සඳහා ප්‍රමුඛතාවය ලබා දිය යුතුවේ. එහිදී, පහත සඳහන් ක්ෂේත්‍ර පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් යොමු කරමින් 2022 වර්ෂය සඳහා වන අයවැය සකස් කළ යුතුය.

1) වසංගත තත්ත්වය පාලනය කිරීම සහ ජන ජීවිතය කඩිනමින් යථාවත් කිරීම
2) දේශීය කෘෂිකර්මාන්තය සඳහා අවශ්‍ය කාබනික පොහොර ප්‍රමාණවත් පරිදි නිෂ්පාදනය කිරීම හා ඒවා නිසි ප්‍රමිතියෙන් යුතු බව තහවුරු කිරීම
3) සංචාරක ක්ෂේත්‍රය පුනර්ජීවනය හා දිරිමත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම
4) සැමට ජලය, වාරි සෞභාග්‍යා, කි.මී. 100,000යේ මාර්ග සංවර්ධනය වැනි දැනට ක්‍රියාත්මක ග්‍රාමීය හා නාගරික යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වන ජාතික වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම.
5) මෙතෙක් ආනයනය කළ නමුත් දේශීයව නිෂ්පාදනය කළ හැකි කර්මාන්ත ප්‍රවර්ධනය කිරීමට පහසුකම් සැලසීම හා අපනයනාභිමුඛ කර්මාන්ත ප්‍රවර්ධනය
    i. සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ක්ෂේත්‍රය නගාසිටුවීම දිරිමත් කිරීම සහ ඒවා සඳහා ජාත්‍යන්තර වෙළඳ අවස්ථා විවෘත වන පරිදි සුදුසු වැඩපිළිවෙලවල් හඳුනාගැනීම
    ii. දේශීය හා විදේශ රැකියා අවස්ථාවලට ගැලපෙන පරිදි ශ්‍රමබලකාය පුහුණු කිරීම හා සංවර්ධනය කිරීම
    iii. වෘත්තිකයින්ට, පුහුණු හා නිපුණ ශ්‍රමිකයන්ට අවස්ථාව සැලසෙන පරිදි නව විදේශ රැකියා අවස්ථා සොයා යාම

iv. විදේශීය වෙළඳපොළ පාදක කරගත් තොරතුරු තාක්ෂණ කර්මාන්ත දිරිගැන්වීම

v. සම්ප්‍රදායික අපනයනයන් හා අමුද්‍රව්‍ය සැපයීම් වෙනුවට අගය එක්කළ නිෂ්පාදන අපනයන දිරිමත් කිරීම කෙරෙහි යොමුවීම

vi. කාබනික කෘෂි නිෂ්පාදන සඳහා ඉල්ලුමක් පවතින විදේශ වෙළඳපල අවස්ථා විවරකර ගැනීම හා නිෂ්පාදන විවිධාංගිකරණය තුළින් අපනයන වැඩිදියුණු කිරීම සඳහා පදනමක් ඇති කර ගැනීම

6) සේවාලාභීන්ට මාර්ගගතව සේවා ලබාගැනීමට හැකිවන පරිදි ඩිජිටල්කරණය රාජ්‍ය ආයතන, පාසැල් සහ විශ්ව විද්‍යාල තුළ පුළුල් ලෙස භාවිතා කිරීම

7) සංවර්ධන ක්‍රියාවලිය කඩිනම් කිරීමට සහය වන ආකාරයෙන් සහ මහජනතාවට පහසුවෙන් රාජ්‍ය ආයතනවලින් සේවා ලබාගැනීමට හැකි වන පරිදි ආයතනික ක්‍රම සරල කිරීම

8) භාණ්ඩාගාරය මත යැපෙන වාණිජ ව්‍යවසායන් ප්‍රතිසංස්කරණය කර ඒවායේ මූල්‍ය ශක්තිය හා ස්ථාවරත්වය ඇති කර ගැනීම.

## 2.2 පුනරාවර්තන වියදම්

### (අ) වැටුප් හා වේතන, අතිකාල සහ වෙනත් දීමනා

2021.07.01 දිනට තත්‍ය සේවක සංඛ්‍යාව පදනම් කරගෙන 2022 වසර සඳහා වැටුප් වේතන සහ වෙනත් දීමනා එක් එක් අය වෙනුවෙන් වෙන් වෙන් ව ගණනය කර එවිය යුතුය. ඒ සඳහා අදාළ සවිස්තරාත්මක තොරතුරු ආයතන මට්ටමින් නිවැරදිව සකසා ඇමුණුම (01) මගින් ඉදිරිපත් කළ යුතුය (මෘදු පිටපත් හෝ දෘඩ පිටපත්).

2022 වර්ෂය තුළ නව බඳවා ගැනීම් අධෛර්යමත් කෙරෙන බැවින් ඒ සඳහා ප්‍රතිපාදන වෙන් නොකරනු ලැබේ.

අනුමත අතිකාල ක්‍රමවේද හා දීමනා සඳහා අවශ්‍ය ප්‍රතිපාදන හැර වෙනත් කිසිදු ආකාරයක අතිකාල හෝ දීමනා සඳහා ඇස්තමේන්තු තුල ප්‍රතිපාදන ඇතුළත් නොකළ යුතුය. පසුගිය වසර කිහිපය තුළ රාජ්‍ය සේවය සඳහා නව බඳවාගැනීම් විශාල වශයෙන් සිදුකර ඇති බවද තාක්ෂණික මෙවලම් විශාල වශයෙන් භාවිතයට යොදවා ඇති බව ද උද්ගත වූ ව්‍යසනකාරී තත්ත්වය හේතුවෙන් ආරම්භ කළ මාර්ගගත ක්‍රමවේදය යටතේ රාජකාරි කිරීම ද සැලකිල්ලට ගනිමින් සාම්ප්‍රදායික ක්‍රමවේදයෙන් බැහැරව අවශ්‍යතාවයන් යලි සමාලෝචනය කර අතිකාල දීමනා ගණනය කල යුතුය.

### (ආ ) සැපයීම් හා ගිවිසුම්ගත සේවා

හැකි සෑම විටම ඊමේල් වැනි මාර්ගගත ක්‍රමවේද මගින් පණිවිඩ හුවමාරු කර ගැනීමට සෑම ආයතනයක්ම දිරිමත් කළ යුතු අතර ඒ අනුව ලිපිද්‍රව්‍ය සඳහා වැයවන වියදම සියයට 5 කින් අඩු කිරීමට අපේක්ෂා කෙරේ.

කොවිඩ් වසංගතය හේතුවෙන් ලබා ගත් අත්දැකීම් පාදක කර ගනිමින් හැකි සෑම විටම අතත්‍ය (Virtual) රැස්වීම් පැවැත්වීමටත් එමඟින් සංග්‍රහ වියදම් හා ගමන් වියදම්, සංයුක්ත දීමනා වැනි වියදම් අඩු කිරීමටත් කටයුතු කළ යුතු වේ. තවද, නව ගොඩනැගිලි කුළියට ලබා ගැනීම සඳහා ඉල්ලුම් නොකළ යුතු අතර දැනට කුළියට ගෙන ඇති ගොඩනැගිලි තවදුරටත් ගිවිසුම් කාලය දික් කිරීමට පෙර රජයේ ගොඩනැගිලි තුළ ඉඩකඩ පහසුකම් සලසා ගැනීම් වැනි රජයට වාසිදායක විකල්ප පිළිබඳව සොයා බලා කටයුතු කළ යුතු ය.

#### (ඇ) සංවර්ධන සහනාධාර හා සුභසාධන වියදම්

සංවර්ධන සහනාධාර හා සුබසාධන වියදම් සඳහා වියදම් ඇස්තමේන්තු කිරීමේදී එක් එක් වැඩසටහන/ යෝජනා ක්‍රමය යටතේ එක් එක් ප්‍රතිලාභියා වෙත ලබාදෙනු ලබන ආධාර මුදල පැහැදිලිව හඳුනාගැනීමට හැකි වන පරිදි ප්‍රතිලාභීන් සංඛ්‍යාව සහිතව සාරාංශ සකස් කර එවිය යුතු ය.

සංවර්ධන සහනාධාර (1504) සහ සුභසාධන වැඩසටහන් (1501) වැය විෂයයන් යටතේ ඇස්තමේන්තු සැකසීමේ දී යම් නීතියක් මඟින් සම්මත කර ඇති හෝ අමාත්‍ය මණ්ඩල අනුමැතියක් සහිත සහනාධාර හැර වෙනත් කිසිදු සහනාධාර හෝ සුභසාධන වැඩසටහනක් සඳහා ප්‍රතිපාදන ඇතුළත් නොකිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් වගබලා ගත යුතුය. එමෙන්ම, අමාත්‍ය මණ්ඩලය විසින් වෙනත් අයුරකින් තීරණය කරනු ලැබුවහොත් මිස දැනටමත් ක්‍රියාත්මක වන සහනාධාර වැඩසටහන් දැනට අනුමත ප්‍රතිලාභීන් සංඛ්‍යාවට පමණක් සීමා කළ යුතු ය.

පොදුවේ රජයේ අරමුදල් භාවිතා කරමින් ක්‍රියාත්මක කරනු ලබන සුභසාධන වැඩසටහන්/ව්‍යාපෘති ද කොවිඩ් -19 වසංගතය හමුවේ ඊට ගැළපෙන පරිදි නැවත සමාලෝචනය කර නිසි අධීක්ෂණයකින් යුතුව ප්‍රතිලාභීන් නිවැරදිව හඳුනාගෙන ද්විකරණය නොවන පරිදි ප්‍රතිව්‍යුහගත කිරීම අවශ්‍ය වේ. මධ්‍යම රජයේ හා පළාත් සභා විසින් කරනු ලබන වැඩසටහන් ඒකාබද්ධ කරමින් සුබසාධන වියදම් ඉලක්ක හා අවශ්‍යම පුද්ගලයින් වෙත යොමුවන බවටත් ප්‍රතිලාභ අවශ්‍ය නොවන පුද්ගලයින් එම වැඩසටහන් වලින් ඉවත්වන ලෙසටත් කටයුතු සලසා ගත යුතුවේ. මේ සඳහා බැංකු ගිණුමක් මඟින් හෝ එවැනි සෘජුව ප්‍රතිලාභියාට පමණක් ප්‍රතිලාභය ලැබීම තහවුරු වන ක්‍රමවේදයක් සකස් කර ගැනීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා කටයුතු කළ යුතුවේ.

මීට අමතරව සහනාධාර/ප්‍රතිලාභ බෙදා හැරීමේ පරිපාලන වියදම් නැවත සමාලෝචනය කර අනවශ්‍ය වියදම් පාලනය අවශ්‍ය වේ.

### 2.3 මූලධන වියදම්

#### (අ) ආයතනික මූලධන වියදම්

ආයෝජනයේ ප්‍රතිලාභ කඩිනමින් ආර්ථිකයට ලැබෙන සංවර්ධන වියදම් සඳහා ප්‍රමුඛතාවය ලබා දිය යුතු බැවින් ආයතනික මූලධන වියදම් හැකිතාක් දුරට සීමා කළ යුතු ය. ඒ අනුව මූලධන වියදම් ඇස්තමේන්තු සකස් කිරීමේදී පහත කරුණු පිළිබඳව දැඩි අවධානය යොමු කළ යුතු ය.

I. නව ගොඩනැගිලි ඉදිකිරීම තාවකාලිකව අත්හිටුවීමට දැනටමත් රජය විසින් ගෙන ඇති තීරණය ඉදිරි වර්ෂ කිහිපයක් සඳහා ද දීර්ඝ කිරීමට තීරණය කර ඇත. ඒ අනුව, දැනටමත් රජය සතු සුළු

අළුත්වැඩියාවකින් පසු ආර්ථිකව ඵලදායී ලෙස යොදාගත හැකි ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කර නැවත භාවිතයට ගැනීම මඟින් තම අවශ්‍යතාවයන් සපුරාගැනීමට යොමුවිය යුතුවේ.

II. ආනයන සීමා කිරීමට රජය ගෙන ඇති තීරණයට සහයෝගයක් ලෙස හා වියදම් සීමා කිරීමේ අවශ්‍යතාවය සළකා රාජ්‍ය ආයතන සඳහා නව ලී බඩු හා කාර්යාල උපකරණ, වාහන මිල දී ගැනීම ඉදිරි වර්ෂයේ දී ද අත්හිටුවීමට සිදු වේ. එබැවින් දැනට ආයතන සතු වාහන අවශ්‍ය පරිදි අළුත්වැඩියාකර ගනිමින් ස්වකීය අවශ්‍යතා සපුරාගත යුතුය. එසේ වුව ද ට්‍රැක්ටර්, ට්‍රක් රථ, ගිලන් රථ, ඉඩම් වාහන සහ අනෙකුත් උපයෝගීතා වාහන අවශ්‍යතාවය අනුව මිල දී ගැනීම පිළිබඳ ව ඒ ඒ අවස්ථාවන් හි දී භාණ්ඩාගාරය විසින් සුදුසු පරිදි තීරණය කරනු ඇත.

III. දේශීයව ගෙවීම් කල යුතු විදේශ පුහුණු අත්හිටුවිය යුතු අතර, අතත්‍ය (Virtual) ක්‍රම මගින් පැවැත්වෙන පාඨමාලා මගින් හැකි සෑම විටම පුහුණු අවශ්‍යතා සපුරාගැනීමට කටයුතු කල යුතුය.

IV. රාජ්‍ය ආයතනවල කාර්යයන් කාර්යක්ෂම කිරීම සඳහා මෘදුකාංග සංවර්ධනය කිරීම/මිල දී ගැනීම සිදු කළ ද ඒවායේ තිරසාර බව පිළිබඳ ගැටළු මෙන් ම ඒවා තුළින් අපේක්ෂිත අරමුණු ඉටු නොවන අවස්ථා ද බහුල ව නිරීක්ෂණය වන බැවින් ආයතනයේ දැනට පවත්නා ක්‍රියාවලිය/වැඩ ගලා යාම පිළිබඳ හොඳින් අධ්‍යයනය කර නිවැරදිව අවශ්‍යතාවය හඳුනා ගෙන එහි තිරසාර බව සහතික වන අයුරින් ක්‍රමවේද සකස් කිරීමෙන් අනතුරුව යෝග්‍යවන පරිදි මෘදුකාංග සංවර්ධනය සඳහා යොමුවිය යුතුය.

**(ආ) සංවර්ධන වියදම්**

සැළකිය යුතු මූල්‍ය පිරිවැයක් දරමින් දේශීයව හෝ විදේශීයව ලබා ගන්නා අරමුදල් මඟින් සංවර්ධන ව්‍යාපෘති මූල්‍යකරණය සිදුකරන බැවින් එම ආයෝජනයන් හි ප්‍රතිලාභ අපේක්ෂිත පරිදි නියමිත කාල රාමුව තුළ ජනතාව වෙත ලබා ගැනීමට හැකිවන පරිදි දැනට ක්‍රියාත්මක ව්‍යාපෘති සමාලෝචනය කර කඩිනමින් නිම කිරීමට ප්‍රමුඛත්වය දිය යුතු බව අවධාරණය කෙරේ.

I. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී තනි ව්‍යාපෘතියක් ලෙස නොසලකා, එම ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කරන අනෙකුත් ව්‍යාපෘති සමඟ සම්බන්ධීකරණයක් සහිතව ද්වීකරණයන් ඇති නොවන පරිදි ඒකාබද්ධ සංවර්ධන ප්‍රවේශයකින් යුතු ව ක්‍රියාත්මක කිරීමට රජය විසින් ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇති බැවින් දැනට ක්‍රියාත්මක ව්‍යාපෘති ද හැකිතාක් දුරට එම සංකල්පයට අනුගත වන පරිදි සමාලෝචනය කළ යුතු ය. විශේෂයෙන් යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ආයතන විසින් එම ව්‍යාපෘතියට බලපෑම් ඇති කළ හැකි අනෙකුත් යටිතල පහසුකම් සපයන ආයතන හා ක්‍රියාදාමයන් සඳහා සම්බන්ධවන ආයතන සමඟ මනා සම්බන්ධීකරණයකින් යුතුව කටයුතු කර ව්‍යාපෘති ප්‍රමාද වීම හා නාස්තිය අවම කර ගැනීමට කටයුතු කළ යුතු ය. ඒ අනුව ප්‍රාදේශීය වශයෙන් මහාමාර්ග, ජලසම්පාදන, ඉඩම්, විදුලිබල, තක්සේරු, මිනින්දෝරු, සන්නිවේදන ආදී කාර්යයන් පැවරී ආයතන එක්වී සාකච්ඡාකර ප්‍රදේශයේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහයෝගී ප්‍රවේශයක් සහිතව කලයුතු වේ.

II. විදේශ ණය මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී දේශීය ශ්‍රමය, උපදේශන සේවා, අමුද්‍රව්‍ය සහ උපකරණ (materials) යොදා ගැනීමට හැකිවන පරිදි ගිවිසුම් ඇතිකර ගැනීමට එම ව්‍යාපෘති සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමේදී (negotiation) කටයුතු කළ යුතුය.

III. 2022 අයවැය ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වන අංක 21/1360/304/114 හා 2021.07.27 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි විදේශීය ප්‍රභවයන් මගින් මූල්‍යනය වන ව්‍යාපෘති සම්බන්ධයෙන් සැලසුම් සහගත පරිදි මුදල් ලබාගැනීමේ වැදගත්කම සහ එවැනි ව්‍යාපෘති සඳහා පොළියට අමතරව බැඳීම් ගාස්තුද (commitment fees) ගෙවීමට සිදුවන බව අවධානයට ගෙන එම ව්‍යාපෘති ප්‍රමාදයකින් තොරව නිම කිරීමට හැකිවන පරිදි අවශ්‍ය කටයුතු කල යුතුය.

IV. දේශීය මූල්‍යණය යටතේ ක්‍රියාත්මකවන හා කාල නියමයක් සඳහන් නො වන ව්‍යාපෘති නැවත සමාලෝචනය කර ව්‍යාපෘතිය අවසාන වන කාලසීමාව නියමකරගෙන ඒ අනුව ප්‍රතිපාදන ඉල්ලුම් කලයුතුය. මේ වන විටත් කාල සීමාව ඉක්මවා ඇති ව්‍යාපෘති සඳහා පසුගිය බැඳීම් නොපවතින්නේ නම් ප්‍රතිපාදන ඉල්ලුම් නො කළ යුතු ය. සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධ ඇස්තමේන්තු ඇමුණුම 02 හි තොරතුරුද සහිතව ඉදිරිපත් කල යුතුය.

V. ඇතැම් අවස්ථා වලදී කුඩා පරිමාණ ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක කිරීම සඳහා සාමූහික ප්‍රතිපාදනයන් යම් උප ව්‍යාපෘතීන් යටතේ හෝ වැය විෂය විස්තරයක් යටතේ වෙන් කරන අවස්ථාවන් ඇති අතර (නිදසුන්: සෞඛ්‍ය, අධ්‍යාපන අමාත්‍යාංශ) එවැනි ව්‍යාපෘති වල නිශ්චිත තොරතුරු ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලෙසට දැනටමත් ඔබ වෙත දැනුම් දී ඇත. (අංක NP/IMF/TRN/MI/2021/01 හා 2021.05.05 දරන ලිපිය මගින්)
එවැනි ව්‍යාපෘතින් සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවෙන් සමාලෝචනයක් ලබා ගැනීමෙන් අනතුරුව ප්‍රතිපාදන වෙන්කිරීමට තීරණය කර ඇති බැවින් අදාල තොරතුරු නොපමාව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ලබා දීමට කටයුතු කළ යුතුය.

## 2.4 පොදු උපදෙස්

I. කොවිඩ් - 19 වසංගත තත්ත්වය යටතේ තාවකාලික පදනමින් අත්‍යවශ්‍ය වියදම් පියවා ගැනීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා දුන් රාජ්‍ය ආයතන වෙත 2022 වර්ෂයේදී එලෙස ප්‍රතිපාදන ලබා නො දෙන බැවින් එම ආයතන ස්වකීය වියදම් ආවරණය කර ගැනීමට හැකි වන පරිදි ආදායම් වර්ධනය කර ගැනීමට හා වියදම් කළමනාකරණය කර ගැනීමට කටයුතු කරන බවට ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් වග බලා යුතු ය.

II. ස්වයං මූල්‍යකරණය අරමුණු කරගනිමින් ස්ථාපිත කර ඇති රාජ්‍ය ආයතන විසින් ඵලදායී ලෙස ක්‍රියාත්මක කල හැකි ව්‍යාපාරික සැලසුම් සකස් කොට ඒවා නිසි අයුරින් ක්‍රියාත්මක කිරීම අදාළ අමාත්‍යාංශ මගින් අධීක්ෂණයකර තහවුරු කළ යුතු ය.

III. එසේම, තිරසර සංවර්ධන ඉලක්ක ලඟාකරගැනීම සම්බන්ධයෙන් ජනාධිපති කාර්යාලය විසින් නිකුත් කර ඇති අංක PS/SP/SB/C/22/2019 හා 2019.10.03 දිනැති චක්‍රලේඛය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව වරින් වර කාන්තා කටයුතු විෂයභාර අමාත්‍යාංශය විසින් නිකුත්කර ඇති උපදෙස් හා මාර්ගෝපදේශ කෙරෙහිද අවධානය යොමු කලයුතු වේ.

IV. එක් අමාත්‍යාංශයක් මගින් ආරම්භ කරන ලද වැඩසටහන්/ව්‍යාපෘති, අමාත්‍යාංශ වල විෂයය පථයයන් විටින් විට වෙනස්වීම හේතුවෙන් වෙනත් අමාත්‍යාංශයක් යටතට වෙන්වූ විට මුල් සැලසුම් වලට අනුව කටයුතු කිරීම වෙනුවට නව සැලසුමකට අනුව කටයුතු කිරීම හේතුවෙන් බොහෝවිට මුල් සැලසුමට අනුව එතෙක් කල වැඩ සඳහා ගෙවීම් නොකර නව සැලැස්ම සඳහා මුදල් යෙදවීම සිදුවේ. එවැනි තත්වයන් ඇති නොවන සේ කටයුතු කලයුතු අතර අයවැය සැකසීමේදීත්, ගෙවීම් කිරීමේදීත් සෑම විටම හිඟ හිටි වියදම් සඳහා ප්‍රතිපාදන වෙන් කර ගෙන ගෙවීම් කිරීමට ප්‍රමුඛත්වය ලබාදිය යුතුය. එසේ කටයුතු නොකර ඊලඟ වර්ෂය තුලදී අමතර ප්‍රතිපාදන ඉල්ලීම් කලහොත් එම ඉල්ලීම් භාණ්ඩාගාරය විසින් ප්‍රමුඛත්වයෙහිලා නොසලන බැවින් මේ සම්බන්ධයෙන් දැඩි අවධානය යොමු කළ යුතු වේ.

V. අයවැය සකස් කිරීමේදී වියදම් ප්‍රමුඛතාගත කල යුතු ආකාරය පහත පරිදිවේ.

- පසුගිය වසර වලදී හෝ මෙම වසරේදී පියවීමට නොහැකිව පවතින හා දැනට ප්‍රතිපාදන වෙන්වී නොමැති වියදම් සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම
- දැනටමත් ප්‍රමාදවී ඇති ව්‍යාපෘති කඩිනමින් නිම කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම
- නියමිත පරිදි ක්‍රියාත්මක වන ව්‍යාපෘති/ වැඩ සඳහා අවශ්‍ය ඉතිරි ප්‍රතිපාදන වෙන් කිරීම
- මූලධන වත්කම් ප්‍රතිසංස්කරණය හා වැඩිදියුණු කිරීම සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම
- අනෙකුත් අත්‍යවශ්‍ය වියදම් සඳහා ප්‍රතිපාදන

### 3. අත්තිකාරම් ගිණුම්

රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් සම්බන්ධ ඇස්තමේන්තු ඇමුණුම (03) මගින් ලබාදී ඇති ආකෘතිය අනුව ඉදිරිපත් කළ යුතුය. වාණිජ අත්තිකාරම් ගිණුම් පවත්වාගෙන යනු ලබන ආයතන විසින් ඒ සම්බන්ධයෙන් වන ඇස්තමේන්තු ප්‍රමාණවත් තොරතුරු ඇතුලත් වන පරිදි සුදුසු ආකෘතියකින් ඉදිරිපත් කල යුතුය.

### 4 . වියදම් ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම

ඉහත කරුණු සලකා බලා නිසි පරිදි පිළියෙළ කරනු ලබන වියදම් ඇස්තමේන්තු අදාළ සියලුම උපලේඛණ ද සමඟ 2021 අගෝස්තු 16 දින හෝ ඊට ප්‍රථම ඒකාබද්ධ භාණ්ඩාගාර මෙහෙයුම් පද්ධතිය (ITMIS ) හරහා ඉදිරිපත් කළ යුතුය. 2022-2024 වර්ෂ සඳහා වන මධ්‍යකාලීන අයවැය ඇස්තමේන්තුව තුළ 2022 වර්ෂය සඳහා වන වාර්ෂික අයවැය ඇස්තමේන්තුව සහ වර්ෂ 2023-2024 සඳහා වන පුරෝකථන අයවැය ඇස්තමේන්තු මෙම මාර්ගගත පද්ධතිය ඔස්සේ ඇතුළත් කිරීම අනිවාර්ය වේ. ඊට අමතරව එම ලේඛන වල දෘඩ පිටපත් ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අදාළ මාණ්ඩලික නිලධාරියා වෙත ඉදිරිපත් කළ යුතුය. ITMIS පද්ධතියට දත්ත ඇතුළත් කිරීම සඳහා යම් සහායක් අවශ්‍ය වන්නේ නම්, දුරකථන අංක 011-2484999 හරහා ITMIS helpdesk නිලධාරීන් සම්බන්ධ කර ගැනීමට කටයුතු කළ යුතුය.

**5. පැහැදිලි කරගැනීම**

මේ සම්බන්ධයෙන් තවදුරටත් පැහැදිලි කර ගැනීමට අවශ්‍ය නම් ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ ඔබ අමාත්‍යංශය/ දෙපාර්තමේන්තුව /ආයතනය පිළිබඳව වගකීම දරණ අදාළ නිලධාරියා සම්බන්ධ කර ගැනීමට කටයුතු කළ යුතුය.

එස්.ආර්.ආටිගල
භාණ්ඩාගාර ලේකම්

පිටපත් :

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
4. විගණකාධිපති